ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021/2022
1 වන මට්ටම - II වන වර්ෂාර්ධය
අවසාන විභාගය
DSC1714 - නීතිය පිළිබඳ සංකල්ප හා අවබෝධය

කාලය: පැය තුනයි

දිනය: 2023 පෙබරවාරි 11 වේලාව: පෙ.ව. 9.30 - ප.ව. 12.30

උපදෙස්:

- ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නවයකින් (09) සමන්විත වේ.
- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැහැදිලිව ලිවිය යුතුය.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු නව පිටුවකින් ආරම්භ විය යුතුය.

**1.** වලංගු ගිවිසුමක් ඇති කර ගැනීම සම්බන්ධයෙන් ගිවිසුම් නීතියට අදාළව පහත සඳහන් අවස්ථා පැහැදිලි කරන්න. එක් එක් අවස්ථාව සඳහා උදාහරණයක්ද ඉදිරිපත් කරන්න.

I. අර්පණය
II. ප්‍රතිග්‍රහණය
III. ප්‍රතිෂ්ඨාව
IV. ගිවිසුම් සඳහා එළඹිය නොහැකි පුද්ගලයින්
V. නීති විරෝධී ගිවිසුම්

(ලකුණු 4 x 5 = 20)

**2.** "විවිධ ජාතීන් නියෝජනය කරමින් නීති පද්ධති කිහිපයක් ක්‍රියාත්මක වීම තුළින් රටක බහුවිධ නීති පද්ධතියක් නිර්මාණය වේ."
ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**3.** රටක යුක්තිය පසිඳලීමේ උත්තරීතර කාර්යය පැවරී ඇත්තේ අධිකරණය වෙතය. ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ කාර්යයේ නියුතු අධිකරණ පද්ධතිය නම්කර එක් එක් අධිකරණයන්හි අධිකරණ බලය පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**4.** සෙලනිකා යනු සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයකි. පසුගිය වසර කිහිපය තුළ ආණ්ඩුවේ අදූරදර්ශී දේශපාලන තීරණ නිසා සෙලනිකාහි ආර්ථිකය ක්‍රමයෙන් පරිහානියට පත් විය. ආර්ථික පීඩනය දරා ගත නොහැකි ජනතාව වීදි බසින්නට වූ අතර රට පුරා සාමකාමී උද්ඝෝෂණ පැවැත්විය. නිව්ටන්, උපුල්, බාලචන්ද්‍රන්, නීලා සහ ෆාතිමා යනු සම වයසේ මිතුරන් පස් දෙනෙක් වන අතර ජන හඬ නමින් මෑතකදී සෙලනිකාහි අගනුවර පැවති සාමකාමී උද්ඝෝෂණයකට ඔවුන් සිව්දෙනාද සහභාගි වූහ. නීලා එහිදී ජනතාව මුහුණපාන ගැටළු සම්බන්ධයෙන් මාධ්‍යයටද අදහස් දැක්වූ අතර එය එදින රාත්‍රී පුවත් ප්‍රකාශය තුළින්ද එය විකාශය විය.

සෙලනිකා රාජ්‍යයේ නීතිය ශ්‍රී ලංකාවේ නීතිය හා සමාන යැයි උකල්පනය කරන්න. පහත සඳහන් අවස්ථාවන්හිදී උල්ලංඝනය වී ඇති මූලික අයිතිවාසිකම් මොනවාද යන්න පැහැදිලි කරන්න.

I. නිව්ටන් රජයේ දෙපාර්තමේන්තුවක සාමාන්‍ය සේවකයෙක් වන අතර රැකියා ස්ථානයේ කාර්යයන් නිසි පරිදි ඉටු කරන්නෙකි. වසර අවසානයේ සේවාවේ ඉහළ දැමීමක් හිමි විය යුතුව තිබුණද ඔහුගේ දේශපාලන මතය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් දෙපාර්තමේන්තු කළමනාකාරීත්වය ඔහුට එම සේවා ඉහළ දැමීමක් ලබා නොදීමට තීරණය කරනු ලැබීය.

II. රජයේ අමාත්‍යාංශයක කළමනාකරුවකු වන උපුල් සිය ආයතනය තුළ සේවක සමිතියක් පිහිටුවා ඒ හරහා සිය ආයතනයේ සේවකයනගේ සහභාගීත්වයද පවත්නා උද්ඝෝෂනයන්ට ලබා දීමට අදහස් කළේය. නමුත් ආයතනයේ සේවකයන්ට එළෙස සමිති පිහිටුවා ගැනීමට නොහැකි බව අමාත්‍යාංශ ලේකම් උපුල්ට දැන්වීය.

III. උද්ඝෝෂණයට සහභාගී වූ දිනයේ රාත්‍රියේදී බාලචන්ද්‍රන්ගේ නිවසට පැමිණි පොලිස් නිළධාරීන් පිරිසක් කිසිදු හේතුවක් නොදන්වා බාලචන්ද්‍රන්ව පොලිසියට රැගෙන ගියේය.

IV. රජයේ දෙපාර්තමේන්තුවක සංවර්ධන නිළධාරිනියක වූ නීලා විසින් උද්ඝෝෂණයේදී දක්වන ලද අදහස් පිළිබඳ නොසතුට පළ කළ ඇයගේ දෙපාර්තමේන්තුප්‍රධානියා ඇයට නැවත එළෙස අදහස් පළ නොකරන ලෙස තරයේ අවවාද කළේය.

V. ෆාතිමා රජයේ ආයතනයක පැවති සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වූ අතර ඇය ඉන් ඉහළම සුදුසුකම් සපුරා තිබුණි. නමුත් ඇයගේ ආගම පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් ඇයව එම ආයතනයට බඳවා නොගැනීමට ආයතනයේ ප්‍රධානියා තීරණය කරනු ලැබීය.

**(ලකුණු 4 x 5 = 20)**

5. සේවා සේවක සබඳතාවන්හි ගැටළු නිරාකරණය කිරීම සඳහා කම්කරු නීතිය මැදිහත් වේ.

I. ශ්‍රී ලංකාවේ කම්කරු සුභසාධනය සඳහා පනවා ඇති ව්‍යවස්ථා 5ක් නම් කරන්න.

(ලකුණු 05)

II. ඉහත ඔබ විසින් නම් කරන ලද ව්‍යවස්ථා අතුරින් ව්‍යවස්ථා දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.

**(ලකුණු 15)**

6. පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීමේ නීතිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා පුවත් පතකට ලිපියක් සකස් කරන්න.

(ලකුණු 20)

7. කෙටි සටහන් ලියන්න.

I. නීතියේ මූලාශ්‍ර
II. අපරාධ නීතිය හා සිවිල් නීතිය
III. විවිධ මාදිලියේ රැකියා
IV. පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය
V. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

**(4 x 5 = ලකුණු 20)**

8. ඔබ, විවාහ කටයුතු සඳහා අදාළ වන නීති අතර විෂමතා සෙවීමට සහ විවාහ කටයුතු සම්බන්ධයෙන් එක් නීතියක් සකස් කිරීම සඳහා පත් කර ඇති කමිටුවක සාමාජිකයකු යැයි උපකල්පනය කරන්න. පහත කරුණු වලට අදාළව ප්‍රශ්න සහ විෂමතා ආමන්ත්‍රණය කරමින් වාර්තාවක් සකස් කරන්න.

- වලංගු විවාහයක් සඳහා වන අවශ්‍යතා
- විවාහය විසුරුවා හැරීම

**(ලකුණු 20)**

9. "බාලවයස්කරුවන් ගේ භාරකාරත්වය සම්බන්ධ නෛතික කටයුතු වල දී අධිකරණය සෑම විටම අවධානයෙන් යොමු කරන්නේ දරුවාගේ උපරිම යහපත නම් සංකල්පයටය."
ශ්‍රී ලංකා නීතිය යටතේ භාරකාරත්වය සම්බන්ධයෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මක සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

***ප්‍රකාශන හිමිකම ඇවිරිණි***